ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.04.08 චක්‍රලේඛ අංක 30/**2026**

සියලු ම දිසා කොමසාරිස්වරුන් වෙත,

**<u>සහකාර දිසා කොමසාරිස් (වැඩසටහන්) සම්මන්ත්‍රණය</u>**

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ වැඩසටහන් සහකාර දිසා කොමසාරිස්වරුන් සඳහා පවත්වනු ලබන, සම්මන්ත්‍රණය **<u>2026 අප්‍රේල් මස 25 වන සෙනසුරාදා දින පෙ.ව 9.00</u>** ට ජාතික_බාලදක්ෂ_මූලස්ථාන ශ්‍රවණාගාරයේ දී පැවැත් වේ.

ඒ සඳහා ඔබ දිසාවේ **<u>වැඩසටහන් සහකාර දිසා කොමසාරිස්</u>** සහභාගී කරවන මෙන් දන්වා සිටිමු. දැනට වැඩසටහන් කටයුතු භාර සහකාර දිසා කොමසාරිස්වරයකු නොමැති නම් ඒ සඳහා සුදුසු අයකු කඩිනමින් නම් කර එවීම අත්‍යවශ්‍ය බව සලකන්න. එදින රැස්වීම සඳහා සහභාගී වන සියලුම දෙනා නිල ඇඳුමෙන් පැමිණිය යුතු බව දන්වා සිටින අතර, ඔබ වෙත ලබා දී ඇති ගූගල් පෝරමය සම්පූර්ණ කර **2026 අප්‍රේල් මස 20** වන දිනට පෙර අප වෙත ලබා දීමට දැනුම්වත් කරන ලෙස දන්වා සිටිමු.

එදින පැමිණීමේ දී පහත ලියකියවිලි රැගෙන පැමිණීම සම්මන්ත්‍රණය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා පිටුවහලක් වේ.

- ඔබේ දිස්ත්‍රික්කයේ බාලදක්ෂ කණ්ඩායම් පිළිබඳ තොරතුරු අඩංගු වාර්තාවක්
- දිස්ත්‍රික් වැඩසටහන් කණ්ඩායමේ සාමාජිකත්ව විස්තර.
- වැඩසටහන් කණ්ඩායමේ ක්‍රියාකාරී සැලැස්ම.
- 2027 නව වැඩසටහන සැකසීමට අදාල සමීක්ෂණ පත්‍රිකා 50

වැඩසටහන් අංශය උසස් මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ඔබ සැමගේ දායකත්වය ගෞරවයෙන් අපේක්ෂා කරමු.

මේ පිළිබඳ ඔබගෙන් ලැබෙන සහය අගය කොට සලකමු.

ස්තූතියි,
මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

***ගීත් රමේෂ්***
ජාතික වැඩසටහන් කොමසාරිස්

***නීතිඥ. මනෝජ් නානායක්කාර***
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

**පිටපත් -** ජාතික මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන් (දැ.ගැ.පි)
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික
ජාතික වැඩසටහන් කොමසාරිස් - ලිපිගොනුවට